**2026.06.03 වන දින කළුතර දිස්ත්‍රික්කයේ මිල්ලනිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ බටගොඩ පිහිටි මව්පිය සෙවණ සෙනෙහසේ කැදැල්ල නිවාසයේ සිදුවූ ගිනිගැනීම සම්බන්ධව දැනට වාර්තා වී ඇති තොරතුරු**

| | |
|---|---|
| **1. ස්ථානයේ නම** | මව්පිය සෙවණ සෙනෙහසේ කැදැල්ල නිවාසය |
| **2. සිදුවීම සිදුවූ දිනය** | 2026.06.03 |
| **3. සිදුවීම සිදුවූ වේලාව** | ප.ව 4.30 ට පමණ |
| **4. සිදුවීම** | හදිසි ගිනිගැනීම් තත්ත්වයක් |
| **5. නිවාසය අයත් ග්‍රාම නිලධාරී කොට්ඨාසය** | 649 - බටගොඩ |
| **6. නිවාසය පිහිටි ස්ථානයේ ලිපිනය** | නො. 62, බටගොඩ පාසල ඉදිරිපිට, බටගොඩ, ගල්පාත. |
| **7. නිවාසයේ දුරකථන අංක** | 0740919199 / 0768962401 |
| **8. නිවාසයේ හිමිකාරීත්වය** | ඉසුරු අනුෂ්ක පෙරේරා මයා |
| **9. නිවාසය ආරම්භ කර ඇති දිනය** | 2024.11.30 |
| **10. නිවාසය ලියාපදිංචි කර ඇති ආයතනය *(ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ලේකම් කාර්යාලය / බස්නාහිර පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුව / ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය)*** | කිසිඳු රජයේ ආයතනයක ලියාපදිංචි කර නොමැත |
| **11. ගිනිගැනීම සිදුවන අවස්ථාවේ රැඳී සිටි නේවාසිකයන් සංඛ්‍යාව** | 70 පමණ |
| **12. සේවය කරන ලද කාර්ය මණ්ඩලය** | හිමිකරුද සමඟ 05 |
| **13. රැඳී සිටින ලද නේවාසිකයන්ගේ ස්වභාවය** | මානසික ආබාධ තත්ත්වයෙන් පෙළෙන පුද්ගලයන් - 62<br>වැඩිහිටියන් - 08 |
| **14. මිය ගොස් ඇති බවට දැනට වාර්තා වන සංඛ්‍යාව** | 12 (ස්ථිර කර නොමැත) |
| **15. රෝහල් ගතකර ඇති බවට දැනට වාර්තා වන සංඛ්‍යාව** | 07 (ගැහැණු - 03 / පිරිමි - 04) |
| **16. බටගොඩ පාසලෙහි දැනට නවාතැන් ගෙන සිටින බවට වාර්තා වන සංඛ්‍යාව** | 50 (ගැහැණු - 21 / පිරිමි - 29) |
| **17. අතුරුදහන් වී ඇති බවට දැනට වාර්තා වන සංඛ්‍යාව** | 02 |
| **18. ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලයේ වැඩිහිටි නිවාස ලියාපදිංචිය සඳහා වූ නීතිමය පසුබිම** | 2011 අංක 05 දරන වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනතින් සංශෝධිත 2000 අංක 09 දරන වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනතෙහි 16(1) වගන්තිය ප්‍රකාරව සඳහන් කර ඇති ආකාරය වැඩිහිටියන්ට නේවාසික සත්කාරය සපයනු ලබන ආයතනයක් පිහිටුවා පවත්වාගෙන යන ස්වේච්ඡා හෝ අන්‍යාකාරයක සැම තැනැත්තෙකු හෝ සංවිධානයක් විසින්ම ඒ ආයතනය වැඩිහිටි තැනැත්තන් 05 දෙනෙකුට වඩා නේවාසිකව සිටින ආයතනයක් වන්නේ නම්, මේ පනතේ දැක්වෙන විධිවිධාන වලට අනුව ලියාපදිංචි විය යුතුය. |
| **19. මේ වන විට ගෙන ඇති ක්‍රියාමාර්ගය** | • වැඩිහිටි කාන්තාවන් 04 දෙනා සහ වැඩිහිටි පිරිමි පුද්ගලයන් 04 දෙනා රජයේ කතරගම Silver Age Centre වැඩිහිටි රැකවරණ, පුහුණු හා පර්යේෂණ මධ්‍යස්ථානය වෙත යොමුකිරීමට කටයුතු කර ඇත.<br>• අනෙකුත් මානසික ආබාධ තත්ත්වයෙන් පෙළෙන |

| | |
|---|---|
| | පුද්ගලයන්ගේ භාරකරුවන් පැමිණ ඔවුන් රැගෙන යන්නේ නම්, ඒ සඳහා අවස්ථාව ලබාදෙන අතර, එසේ නොමැතිව ඉතිරිවන පිරිස රජයේ ලියාපදිංචි ආබාධිත තැනැත්තන් රඳවා තබන නිවාස වෙත ඇතුලත් කිරීමට කටයුතු කිරීමට මේ වන විට තීරණය කර ඇත.<br>• මෙම ආයතනය කිසිඳු රජයේ ආයතනය ලියාපදිංචි කිරීමකින් තොරව හා රජයේ නිසි මාර්ගෝපදේශවලට අනුකූල නොවන පරිදි පවත්වාගෙන යාම හේතුවෙන්, මේ සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණ සිදුකර ඉදිරි නීතිමය ක්‍රියාමාර්ග සිදුකිරීම සඳහා අඟුරුවාතොට පොලිස් ස්ථානය දැනුවත් කර ඇත. |